සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

28 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

**1.** (i) අභ්‍යන්තර අවකාශ නිර්මාණකරණය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(ii) පානීය ජලය ආරක්ෂිත වීම සඳහා තිබිය යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

(iii) 'අසම්පූර්ණ ප්‍රෝටීන්' යන්න අර්ථ දක්වන්න.

(iv) තීව්‍ර මන්දපෝෂණය හඳුන්වන්න.

(v) ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත **දෙකක්** නම් කරන්න.

(vi) රෙදි පෙර පිරියම් කිරීම වැදගත් වන්නේ ඇයි? මේ සඳහා හේතු **දෙකක්** ඉදිරිපත් කරන්න.

(vii) විවේක ක්‍රියාකාරකම්වල ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

(viii) 'ප්‍රතිචක්‍රීකරණය' හඳුන්වන්න. ඉන් ඇතිවන වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ix) මූලික සංවාදයක් ගොඩනැගීමට සුදුසු මාතෘකා **දෙකක්** සඳහන් කරන්න.

(x) දරුවකුගේ පෞරුෂ වර්ධනය කෙරෙහි බලපාන පූර්ව ප්‍රසව සාධක **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි.)

**2.** (i) භෞතික ජීවන පරිසරයට අයත් මූලික කොටස් **තුන** හඳුන්වන්න. (ලකුණු 03 යි.)

(ii) බාහිර අවකාශ නිර්මාණකරණයේදී සැලකිය යුතු සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(iii) වැසි ජලය සංරක්ෂණයේ ඇති ප්‍රයෝජන **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iv) ඔබගේ නිවසේ පසුගිය මස විදුලි බිල්පතෙහි අගය ඉහළ ගොස් ඇතැයි සිතා එය අවම කරගැනීම සඳහා ඔබ ගන්නා පියවර සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) ජලය මගින් සිරුරට ඉටුවන කෘත්‍ය **තුනක්** ලියන්න. (ලකුණු 03 යි.)

(ii) ආහාරවේල් සැලසුම් කිරීමේදී භාවිත කරන පහත සඳහන් මූලාශ්‍ර කෙටියෙන් පැහැදිලි කරන්න.

(a) නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහන (RDA)

(b) පෝෂණ වගු (ලකුණු 04 යි.)

(iii) වයස්ගත වැඩිහිටියන්ගේ පෝෂණමය අවශ්‍යතා සපුරාලීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iv) ගර්භණී මවක් සඳහා දිනක බොජුන්පතක් සැලසුම් කරන්න. (ලකුණු 05 යි.)

4. (i) ක්ෂුද්‍රජීවීන්ගේ වර්ධනයට බලපාන අභ්‍යන්තර සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03 යි.)
(ii) කාමරය සූර්යාලෝකයෙන් ආහාර වියළීමේ **අවාසි** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)
(iii) යෝගට් සෑදීමේ ක්‍රියාවලිය ගැලීම් සටහනක් ඇසුරෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි.)
(iv) සුළු පරිමාණ යෝගට් නිෂ්පාදන ව්‍යාපාරයක තත්ත්ව පාලනය සඳහා අනුගමනය කළහැකි මනා කළමනාකරණ උපක්‍රමවලට (GMP) අදාළ කරුණු **පහක්** සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

5. (i) මෝස්තර නිර්මාණය සඳහා තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි.)
(ii) මේස දරණුවක් නිර්මාණයේදී අනුගමනය කළයුතු පියවර අනුපිළිවෙළින් දක්වන්න. (ලකුණු 05 යි.)
(iii) (a) මේස දරණුවක් අලංකාර කිරීම සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න.
(b) මෙම මෝස්තරය මැසීමේදී,
- යොදන මැහුම් ක්‍රම
- තෝරාගන්නා වර්ණ සහ
- එම මැහුම් ක්‍රම යොදන ස්ථාන

ඉදිරිපත් කරන්න. (ලකුණු 08 යි.)

6. (i) 'ක්‍රියාකාරී ආහාර' යනුවෙන් තුමක් අදහස් වේ ද? (ලකුණු 02 යි.)
(ii) ඖෂධීය ශාක වර්ග **හතරක්** නම් කර, ඒ එකිනෙකෙහි ප්‍රයෝජනය බැගින් ලියන්න. (ලකුණු 04 යි.)
(iii) (a) සංචාරක ආකර්ෂණ වර්ග කර දක්වන්න.
(b) ඉහත (a) හි සඳහන් එක් එක් වර්ගය සඳහා උදාහරණ **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි.)
(iv) 'සියලුම ගමන් බිමන් සංචරණ ලෙස හැඳින්විය නොහැක.' විමසන්න. (ලකුණු 06 යි.)

7. (i) නව යොවුන්වියේ සිදුවන බුද්ධි වර්ධනය පිළිබිඹු කරන හැකියා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)
(ii) වර්තමානයේ දරුවා අධ්‍යාපනය හා සම්බන්ධව මුහුණ දෙන ගැටලු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)
(iii) නව යොවුන්වියේ දරුවන්ගේ මානසික නිරෝගීතාව වර්ධනය සඳහා පාසල මගින් ගතයුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)
(iv) යොවුන් දරුවන් යහමග යැවීම සඳහා පවුල සතු කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

8. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) නිර්මාණකරණයේදී භාවිත කරන වර්ණ
(ii) ස්ථූලතාව නිසා ඇති වන සෞඛ්‍යමය ගැටලු
(iii) නිමි ඇඳුම් කර්මාන්තයේදී භාවිත වන 100 වර්ගයට අයත් මැහුම්
(iv) කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ඇති වූ බලපෑම
(v) ඉනළ (ධන) ස්වසංකල්පයකින් යුක්ත දරුවෙකු තුළ පවත්නා ලක්ෂණ

(ලකුණු 04 × 4 = 16 යි.)

* * *